# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත

## பிரதான செயலாளர் அலுவலகம் - தென் மாகாணம்

## CHIEF SECRETARY'S OFFICE - SOUTHERN PROVINCE


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My Ref. | CSS/7/1/4 | ඔබේ අංකය<br>உனது இல<br>Your Ref. | | දිනය<br>திகதி<br>Date | 2019.07.15 |

ප්‍රධාන ලේකම් උපදෙස් ලිපි (මුදල්) 04-2019

දකුණු පළාතේ සියලු ම

ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන් හා

ගණන් දීමේ නිලධාරීන් වෙත,

**<u>අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම - 2019</u>**

**<u>රාජ්‍ය ආයතන විසින් සේවා සම්පාදනය සඳහා අය කරනු ලබන ගාස්තු</u>**

උක්ත කරුණ සම්බන්ධව මහා භාණ්ඩාගාර ලේකම්ගේ රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක: 01/2018(i) හා 2019.06.13 දිනැති ලිපිය කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි. (අදාළ චක්‍රලේඛයේ පිටපතක් මේ සමඟ අමුණා ඇත.)

02. සියළුම රාජ්‍ය ආයතන විසින් සපයනු ලබන්නා වූ විවිධ සේවාවන් සඳහා, දැනට අය කරනු ලබන ගාස්තු, 2016 වර්ෂයේ සිට මේ දක්වා ගාස්තු සංශෝධනය කර නොමැති නම්, එම ගාස්තු 15%කින් ඉහළ දැමීමට උක්ත චක්‍රලේඛය ප්‍රකාරව උපදෙස් ලබා දී ඇත.

03. ඒ අනුව, ඔබ අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව / ආයතනය විසින් ලබාදෙන සේවාවන් සඳහා, ගාස්තු අය කිරීමේ දී, එම සේවා සැපයීම සඳහා වන පරිපාලනමය වියදම් ආවරණය වන ආකාරයටත්, සේවාවන් ලබා ගන්නා මහජනයාට දැරීමට හැකි වන ආකාරයටත්, ඔබ ආයතන විසින් අය කරනු ලබන ගාස්තු 15%කින් සංශෝධනය කළ යුතුය.

04. එබැවින්, ඔබ ආයතනය විසින් සපයනු ලබන්නා වූ විවිධ සේවාවන් සඳහා, දැනට අය කරනු ලබන ගාස්තු, 2016 වර්ෂයේ සිට මේ දක්වා ගාස්තු සංශෝධනය කර නොමැති නම්, එම ගාස්තු 15%ක් දක්වා සංශෝධනය කර, අදාළ අමාත්‍යාංශයේ ලේකම්ගේ නිර්දේශ සහිතව මහා භාණ්ඩාගාරයේ ලේකම්ගේ අනුමැතියට ඉදිරිපත් කිරීම සඳහා, මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත, 2019.07.15 දිනට ප්‍රථම යොමු කිරීමට ඒ පිළිබඳ විස්තරයක් <u>කඩිනමින්</u> මා වෙත එවීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.


ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary: 091 2232343
කාර්යාලය / காரியாலயம் / Office: 091 2234052, 091 2226118
ෆැක්ස් / பெக்ஸ் / Fax: 091 2246299
විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E-mail: chiefsec1@sltnet.lk
වෙබ් අඩවිය / இ தளம் / Web site: www.cs.sp.gov.lk





ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretary's Office, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.


"විශිෂ්ටත්වයෙන් ① ට එන යහපාලනයක්"

05. ඉහත පරිදි ගාස්තු සංශෝධනය කිරීම මහජන යහපත හා ආයතනයේ ඉදිරි පැවැත්ම සඳහා යෝග්‍ය බව හැඟී යන්නේ නම්, එම සංශෝධනය සාධාරණීකරණය කිරීමට අදාළ වන කරුණු හා ලේඛන සහිතව ඉහත (4) පරිදි අදාළ ඉල්ලීම භාණ්ඩාගාරයේ ලේකම්ගේ සළකා බැලීම සඳහා මහා භාණ්ඩාගාරය වෙත යොමු කළ යුතුය.

06. දැනට පවතින ගාස්තුව එලෙසින්ම වැඩි නොකර ගාස්තු ව්‍යුහයේ (Structure) සංශෝධනය සිදු කරන්නේ නම් එම සංශෝධන සඳහා වෙනම ඉල්ලීමක් භාණ්ඩාගාරයේ ලේකම්ගේ සළකා බැලීම සඳහා පහත විස්තර ද සමග මහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කළ යුතුය.

(අ) පැවති ගාස්තු අය කිරීමේ ක්‍රමවේදය අනුව පසුගිය වර්ෂ තුනෙහි නිත්‍ය ආදායම හා යෝජිත ගාස්තු ක්‍රමවේදය යටතේ අපේක්ෂිත ආදායම සංසන්දනාත්මකව

(ආ) අදාළ නව සංශෝධනය සාධාරණීකරණය කිරීමට අදාළ කරුණු

07. එසේම, පසුගිය වර්ෂ 03ක කාලය තුළ අවම වශයෙන් 15%කින් ගාස්තු සංශෝධනය කර ඇති ආයතන වේ නම්, මෙම චක්‍රලේඛයට උප ලේඛන 1 ලෙස අමුණා ඇති ආකෘතිය අනුව, පසුගිය වසර 03හි සංශෝධනය කරන ලද ගාස්තු පිළිබඳව විස්තරයක් මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත යොමු කිරීම සඳහා, **<u>නොපමාව</u>** මා වෙත එවීමට කටයුතු කරන ලෙස ද කාරුණිකව දන්වමි.

08. තවද, යම්කිසි පනතක් හෝ වෙනත් නීතියක් මගින් ගාස්තු සංශෝධනය පිළිබඳව විධිවිධාන සලස්වා ඇති ආයතන වේ නම්, එම පනත/නීතිය මගින් නියම කර ඇති ආකාරයට ගාස්තු සංශෝධනය කර මෙම චක්‍රලේඛයට උප ලේඛන 1 ලෙස අමුණා ඇති ආකෘතිය අනුව සංශෝධනය කරන ලද ගාස්තු පිළිබඳ වාර්තාවක් රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත යැවීම සඳහා, **<u>නොපමාව</u>** මා වෙත එවීමට කටයුතු කරන ලෙස ද වැඩිදුරටත් දන්වමි.

ආර්.සී ද සොයිසා,
ප්‍රධාන ලේකම්,
දකුණු පළාත.

පිටපත්:- 01. භාණ්ඩාගාර ලේකම්, මුදල් අමාත්‍යාංශය - දැ.ගැ.ස.
02. සහකාර විගණකාධිපති, දකුණු පළාත - දැ.ගැ.ස
03. නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම් හා මෙහෙයුම්), දකුණු පළාත - දැ.ගැ.ස.
04. අධ්‍යක්ෂ (අයවැය / ගිණුම් හා ගෙවීම් / අභ්‍යන්තර විගණන), දකුණු පළාත - දැ.ගැ.ස.

# මුදල් අමාත්‍යාංශය
# நிதி அமைச்சு
# MINISTRY OF FINANCE

මහලේකම් කාර්යාලය, කොළඹ 01.
ශ්‍රී ලංකාව

செயலகம், கொழும்பு 01.
இலங்கை

The Secretariat, Colombo 01.
Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office: (94)-11-2484500, (94)-11-2484600, (94)-11-2484700

ෆැක්ස් / பெக்ஸ் / Fax: (94)-11-2449823

වෙබ් අඩවිය / வெப் சைட் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல. / My No.: PFD/RED/CIR/2019/02

ඔබේ අංකය / உமது இல. / Your No.:

දිනය / திகதி / Date: 2019.06. 13

රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක: 01/2018 (i)

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන්

**<u>අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම - 2019</u>**

**<u>රාජ්‍ය ආයතන විසින් සේවා සම්පාදනය සඳහා අයකරනු ලබන ගාස්තු</u>**

2018.01.17 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2018 ට සිදු කරනු ලබන සංශෝධනයක් ලෙස මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලබන අතර 2019 වර්ෂයේ දී සියළුම රාජ්‍ය ආයතන විසින් මහජනතාව වෙත සපයනු ලබන සේවාවන් සඳහා අය කරනු ලබන ගාස්තු සංශෝධනය කිරීම සඳහා මෙම චක්‍රලේඛයෙහි ප්‍රතිපාදන අදාළ කරගත යුතු ය.

02. සියළුම රාජ්‍ය ආයතන විසින් සපයනු ලබන්නා වූ විවිධ සේවාවන් සඳහා දැනට අයකරනු ලබන ගාස්තු 2016 වර්ෂයේ සිට මේ දක්වා සංශෝධනය කර නොමැති නම් එම ගාස්තු 15%කින් ඉහළ දැමීමට 2019 වර්ෂයේ පාර්ලිමේන්තුවේ සම්මත කරන ලද 2019 වර්ෂය සඳහා වූ අයවැය යෝජනාවන්හි 205 වන යෝජනාව අනුව තීරණය වී ඇත.

03. ඒ අනුව, 2016 වර්ෂයේ සිට මේ දක්වා ගාස්තු සංශෝධනය කර නොමැති ආයතන හා 15%කට වඩා අඩු ප්‍රතිශතයකින් ගාස්තු සංශෝධනය කර ඇති ආයතන විසින් එම ගාස්තු 15%ක් දක්වා සංශෝධන කර අදාළ අමාත්‍යාංශයේ ලේකම්ගේ නිර්දේශ සහිතව භාණ්ඩාගාරයේ ලේකම්ගේ අනුමැතියට යොමු කිරීම සඳහා මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත 2019.07.15 දිනට පෙර යොමු කරන මෙන් කාරුණිකව දන්වමි.

04. යම්කිසි ගාස්තුවක් 15%ක උපරිමයකට වඩා අඩු හෝ වැඩි ප්‍රතිශතයකින් වැඩි කිරීම මහජන යහපත හා ආයතනයේ ඉදිරි පැවැත්ම සඳහා යෝග්‍ය බව හැඟී යන්නේ නම් එම සංශෝධනය සාධාරණීකරණය කිරීමට අදාළ වන කරුණු හා ලේඛන සහිතව ඉහත (03) පරිදි අදාල ඉල්ලීම භාණ්ඩාගාරයේ ලේකම්ගේ සළකා බැලීම සඳහා මහා භාණ්ඩාගාරය වෙත යොමු කළ හැකි ය.

Received
2019/7/3

05. පවතින ගාස්තුව එලෙසින්ම වැඩි නොකර ගාස්තු ව්‍යුහයේ (Structure) සංශෝධන සිදු කරන්නේ නම් එම සංශෝධන සඳහා වෙනම ඉල්ලීමක් භාණ්ඩාගාරයේ ලේකම්ගේ සළකා බැලීම සඳහා මහා භාණ්ඩාගාරය වෙත යොමු කළ යුතු ය. එහි දී පහත සඳහන් විස්තර ද අනිවාර්යයෙන්ම ඉදිරිපත් කළ යුතු වේ.

(අ) පැවති ගාස්තු අය කිරීමේ ක්‍රමවේදය අනුව පසුගිය වර්ෂ තුනෙහි තත්‍ය ආදායම හා යෝජිත ගාස්තු ක්‍රමවේදය යටතේ අපේක්ෂිත ආදායම සංසන්දනාත්මකව

(ආ) අදාල නව සංශෝධනය සාධාරණීකරණය කිරීමට අදාල කරුණු

06. තව ද, පසුගිය වසර 03හි ගාස්තු සංශෝධනය කරන ලද ආයතන විසින් මෙම චක්‍රලේඛයේ උපලේඛන 1 ලෙස අමුණා ඇති ආකෘතිය අනුව එසේ සංශෝධනය කරන ලද ගාස්තු පිළිබඳව විස්තරයක් 2019.06.30 දිනට පෙර මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත යොමු කළ යුතු බව ද කාරුණිකව දන්වමි. යම් ආයතනයක් විසින් තම ආයතනය විසින් සපයනු ලබන සේවාවන් සඳහා ගාස්තු අය නොකරන්නේ නම් එම ආයතන විසින් හිස් වාර්තාවක් 2019.06.30 දිනට පෙර මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත යොමු කළ යුතු වේ.

07. යම්කිසි පනතක් හෝ වෙනත් යම් නීතියකින් ගාස්තු සංශෝධනය පිළිබඳව විධිවිධාන සලස්වා ඇති ආයතන විසින් එම පනත/නීතිය මගින් නියම කර ඇති ආකාරයට ගාස්තු සංශෝධනය කර ඉහත (06) හි සඳහන් පරිදි රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත වාර්තාවක් ඉදිරිපත් කිරීම ප්‍රමාණවත් වේ.

**ආර්.එච්.එස්.සමරතුංග**
භාණ්ඩාගාරයේ ලේකම්

පිටපත්: 01. ජනාධිපති ලේකම්
02. අග්‍රාමාත්‍ය ලේකම්
03. අමාත්‍ය මණ්ඩල ලේකම්
04. විගණකාධිපති

උපලේඛනය - I

ආකෘතිය 1

<u>ගාස්තු සංශෝධනය පිළිබඳ විස්තර - 2016/2017/2018</u>

ආයතනයේ නම:- ..................................................

අමාත්‍යාංශය :- ..........................................................

| අවසන් වරට ගාස්තු සංශෝධනය කරන ලද වර්ෂය | සංශෝධනය කරන ලද ගාස්තු වර්ගය | සංශෝධනය කල ගාස්තුව | | 2016/2017/2018 වර්ෂවල එක් එක් ගාස්තුව යටතේ ලබා ගත් මුළු ආදායම (දළ වශයෙන්) රු. | එම ආදායම බැර කරන ලද ආදායම් ශීර්ෂය |
|---|---|---|---|---|---|
| | | වටිනාකම<br>සිට දක්වා | ප්‍රතිශතය | | |
| | | | | | |